තම්බිලුවෙල් - 02 හි එම්. එම්. වී. පාරේ, (මධ්‍ය මහා විද්‍යාල පාරේ), හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 493203940 V) දරන, සෝමසුන්දරම් සුන්දරම්පිල්ලෙයි වන මා විසින් රාසතුරෙයි පිරපාකරන් (තම්බිලුවිල්-02, එම්. එම්. වී. පාරේ පදිංචි) යන අය හට ප්‍රදානය කරන ලද, කල්මුනෙයි ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. එම්. සම්සුඩීඩ් විසින් ලියා සහතික කරන ලද, 2005.04.30 වැනි දින දාතම හා අංක 223 දරන සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය, 2022.10.11

වැනි දින සිට බලපවත්වන පරිදි අහෝසි කර අවලංගු කර, ශූන්‍ය හා බලරහිත කරනු ලැබූ බව ශ්‍රී ලංකා ජනරජයටත්, පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මෙතැන් සිට එකී රාසතුරෙයි පිරපාකරන් යන අය විසින් මා වෙනුවෙන් එළඹෙනු ලබන කිසිදු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වගකියනු නොලබන බව ද ප්‍රකාශ කරමි.

සොමසුන්තරම් සුන්තරම්පිල්ලය.

11-47

---

## දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, අලුත්හේරත්ගම, අංක 105 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ චමින්ද හේරත් වන මම ගෞරව බහුමානයෙන් යුතුව මෙසේ ප්‍රකාශ කර සිටිමි.

මා විසින් වර්ෂ 2021.07.26 වැනි දින මාගේ NW AAH 3376 දරන ත්‍රී රෝද රථයේ ලියාපදිංචි අයිතිය සම්බන්ධයෙන් මා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මාගේ ඇටර්නි බලකරු ලෙස පිළියන්දල තැපැල්, කැස්බෑව, හොරණ පාර, අංක 127/1 යන ලිපිනයේ පදිංචි චමින්ද වීරක්කොඩි (ජා. හැ. අ. 196916701011) යන අය පත්කරමින් සකස් කරන්නට යෙදුන ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමින් ඔහු වෙත ලබා දුන් ඇටර්නි බලතල ආපසු කැඳවන ලද බව ප්‍රකාශ කරමි.

ඒ අනුව මින් ඉදිරියට එකී චමින්ද වීරක්කොඩි යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් ක්‍රියා නොකරන බවත්, ශ්‍රී ලංකා ජනරජයේ සියලු දෙනාට ම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

හේරත් මුදියන්සේලාගේ චමින්ද හේරත්.

11-55

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව මහහුණුපිටිය සෙල්ලකන්ද පාර අංක 356 හි පදිංචි ජයසිංහ ආරච්චිගේ දෝන ඩිල්කි මේරියන් ඉමල්ෂා අප්පුහාමි වන මම, සඳරුස් අයි. රුද්‍රිගු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2019.08.06 වැනි දින සහතික කළ අංක 5668 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කොච්චිකඩේ ඇත්ගාල අංක 406/1 හි පදිංචි ගරු බස්තියන් කෝරළලාගේ ශෂික මනෝජ් රුද්‍රිගු පියතුමා හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජයසිංහ ආරච්චිගේ දෝන ඩිල්කි මේරියන් ඉමල්ෂා අප්පුහාමි.

11-97

---

## විශේෂ ඇටර්නි බලය අහෝසිකර අවලංගු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නෙදර්ලන්තයේ (Netherlands) හි මනාව ස්ථාපිත කරන ලද Janson Bridging International B.V. වන අප සමාගම විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දැනුම් දෙන වග නම්, අපගේ ඇටර්නි බලකරු ලෙස Theodorus, Gijsbertus, Maria van Wijk (නෙදර්ලන්ත ගමන් බලපත්‍ර අංක NT5JF4D51 හිමි) ශ්‍රී ලංකාවේ කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 278 හි 6 වන මහලේ ඇක්සස් ටවර්ස් (Access Towers) කුළුන හි වෙසෙන එකී ඉහත නම් සඳහන් අය වෙත ප්‍රදානය කරන ලද Jelte Gerrit Lagendijk LLM Civil Law Notary සිවිල් නීතිය පිළිබඳ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අප සමාගමේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි (CEO) වන Robert M (Bob Barkel යන අය විසින් ලියා අත්සන් කරන ලද 2018 ජුනි මස 08 වන දින දාතම දරන විශේෂ ඇටර්නි බලය ප්‍රකාරව පවරන ලද විශේෂ ඇටර්නි බලය මෙයින් 2022 නොවැම්බර් මස 01 වැනි දින බලපවත්වන පරිදි මෙයින් අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කර බලරහිත හා ශූනය කරන ලද බවත් දැනුම් දෙන අතර, අප සමාගමේ ලියාපදිංචි ලේඛනගත කරන ලද කාර්යාලය, නෙදර්ලන්තයේ (Netherlands) හි Keizersveer 9, 4273 LD Hank, the Netherlands) පිහිටා ඇති බවත් දැනුම් දෙන අතර, එකී අය ඇටර්නි බලකරුව සිටි ඉහත නම් සඳහන් Theodorus Gijsbertus Maria Van Wijk යන අය විසින් අප සඳහා හෝ වෙනුවෙන් එකී එනම් 2022 නොවැම්බර් මස 01 වන දිනට පසුව සඳහන් අය විසින් එළඹෙනු ලබන හෝ සිදු කරනු ලබන කවර හෝ ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට අප හෝ අප සමාගම කිසිදු වගකීමක් හෝ වගකීම් භාරයක් නොදරනු ලබන බව ද, සියල්ලන් වෙත මෙයින් දැනුම් දෙමු.

Janson Bridging International B. V.
Principal.

11-98

---

## විශේෂ ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දික්වැල්ල, පහමුනේගොඩ ''ලීලාවාස'' යන ලිපිනයේ ස්ථිරව පදිංචි දැනට දකුණු කොරියාවේ 3372 - 26, Yeongseo-ro, Ssangnim myeon, Goryeong -gun, Gyeongsangbuk - do, Republic of Korea යන ලිපිනයේ පදිංචි තුෂාර හේමන්ත කුමානායක (ජාතික හැඳුනුම්පත් අංක 792423400 V හිමි) වන මා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ගාල්ල කලාප කාර්යාලයේ දිනපොත් අංක 960 යටතේ ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 14 කාණ්ඩයේ 72 පත් ඉරුවේ 2008 අගෝස්තු මස 08 වැනි දින ලියාපදිංචි වී ඇති මාතර ප්‍රසිද්ධ නොතාරිස් කීර්ති කලුආරච්චි මහතා විසින් ලියා

සහතික කරන ලද අංක 2522 සහ 2008.07.02 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මත කෝට්ටගොඩ, පාතේගම දකුණ, නාරංගස්හේන යන ලිපිනයේ පදිංචි ආශා නිල්මිනි කුරුප්පු නානායක්කාර (ජාතික හැඳුනුම්පත් අංක 845212732 V හිමි) යන අයට පවරා තිබූ විශේෂ ඇටර්නි බලතල මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බවත්, මින් ඉදිරියට එකී විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව ලද බලය යටතේ ඇය විසින් සිදු කරනු ලබන සියලු ක්‍රියාවන් බල රහිත වන බවත් සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වා සිටිමි.

තුෂාර හේමන්ත කුමානායක,
ඇටර්නි අධිපති.

11-101

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ වූ ප්‍රසිද්ධ දැන්වීමයි

''සීමිත පොදු සමාගම'' යන්නෙන් සිය තත්ත්වය ''සීමාසහිත සමාගම'' බවට වෙනස් කිරීමට අනුරූපීව කොළඹ කොටස් වෙළෙඳපොලෙහි නිල ලැයිස්තුවෙන් සමාගමේ කොටස් ලැයිස්තුව ඉවත් කිරීමට අනුගාමීව ''සීමිත පොදු සමාගම'' යන්නෙන් සිය තත්ත්වය ''සීමාසහිත සමාගම'' බවට වෙනස් කිරීම සලකා බැලීමට සමාගමේ, කොටස්කරුවන් විසින් 2022 මාර්තු මස 29 වැනි දින සම්මත කරගන්නා ලද විශේෂ යෝජනාවකට අනුව 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තියේ නියමයන් අනුව, පහත දැක්වෙන සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පීඑල්සී
සමාගමේ අංකය : පීකිව් 106
ලියාපදිංචි කාර්යාලය : 19 වන මහල, ලංකා බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල, ලංකා බැංකු චතුරශ්‍රය, අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
සමාගමේ අලුත් නම : ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්

එස්එස්පී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින.

11-131

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාවනැල්ල, උඩුමහන, ශ්‍රී මේධන්කර පාර, ඊ 33/1 දරන ලිපිනයේ පදිංචි නාමරත්න බමුණු ආරච්චිල්ලාගේ සම්පත් ප්‍රියන්ත බංඩාර නාමරත්න වන මා විසින් කෑගල්ල, මීපිටිය, බණ්ඩාර වත්ත පදිංචි අසුරුමුනි ආරච්චිගේ දූෂන්ත සංජීව විජේරත්න යන අය මා නමින් සහ මා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් නීතිඥ හා කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ඩබ්ලිව්. ධම්මික කේ. අමරසිංහ මහතා ලියා සහතික කරන ලද අංක 2097 සහ 2022.06.29 දිනැති ඇටර්නි බලපත්‍රය අවලංගු කර අහෝසි කර බලශුන්‍ය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මින් මතු එකී බලපත්‍රය ප්‍රකාරව මා නමින් පෙනී සිටින අසුරුමුනි ආරච්චිගේ දූෂන්ත සංජීව විජේරත්න යන අය විසින් සිදුකරනු ලබන සෑම ක්‍රියාවක් ම බල රහිත හා බල ශූන්‍ය බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාමරත්න බමුණු ආරච්චිල්ලාගේ සම්පත් ප්‍රියන්ත බංඩාර නාමරත්න.

11-150

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

HNB 73 - 2022.

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- ඇඹිලිපිටිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද අංක 4693 හා 2019.10.08 දින දරන උකස් බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පල්ලිය ගුරුගේ නාලක චන්දන ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්. එකී බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ **2022ක් වූ නොවැම්බර් මස 25 වැනි දින ප. ව. 12.30** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිළිබඳ විස්තරය.-*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොත ගම් පත්තුවේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ 214 - පල්ලේගම ග්‍රාම නිලධාරී වසම තුළ ඇඹිලිපිටිය පල්ලේගම ගමේ පිහිටි කිරලවෙල්කටුව නින්දගමේ කොටසක් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. කේ. ඩබ්. මනම්පේරි විසින් සාදන ලද අංක 5639 හා 2012.05.17 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද පර්චස් විසි පහ (පර්. 25) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.09.30 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2022.10.06 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට නෝනාගම පාරේ කි. මී. 2.7ක් පමණ පවර්මින්ට් වැඩපල දක්වා ගොස් දකුණට හැරී එම පාරේ මීටර් 100ක් පමණ ගිය පසු අදාල දේපලට ළගාවිය හැක. තනිමහල් නිවසක් සහිත මෙම දේපළ එම පාරට මුහුණ ලා වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකථන අංක 0779- 663420, 071-3358434
Email : ejayawardhana77@gmail.com

11-32

---

HNB 72 - 2022

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- බටපොල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හ1දුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. වික්‍රමරත්න විසින් ලියා සහතික කරන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ලියන ලද්දාවූ ද,

අංක 1853 හා 2017.03.02 දින දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කොත්තිගොඩ කංකානම්ගේ රවීන්ද්‍ර සමන්කුමාර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්. හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ **2020ක් වූ නොවැම්බර් මස 28 වැනි දින පෙ. ව. 11.30** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිළිබඳ විස්තරය.-*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 75 බටපොල - බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ බටපොල පිහිටි පන්සල ලඟ වත්තේ ලොට් ඒ හි ලොට් 1, 2, 3 සහ 4 යාබදව ඇති ලොට් 1, 2 සහ 3 ඒකාබද්ධ කිරීමක් වන ලොට් ඒ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ඩන්ස්ටන් ආනන්ද විසින් සාදන ලද අංක 1389 හා 2021 ජූලි මස 25 වැනි දින දරන පිඹුරේ ලොට් ඒ 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද රූඩ් එකයි පර්. 8 විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.09.23 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2022.10.04 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - බටපොල හන්දියේ සිට කහව පාරේ කහව දෙසට කි. මී. 1 පමණ ගිය පසු අදාල දේපළට ළඟා විය හැක. අදාල දේපළ ඔබේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෝෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, ගොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779- 663420, 071-3358434
Email : ejayawardhana77@gmail.com

11-33

---

**මහජන බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ''ඩී'' වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ සියනෑ කෝරලේ මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ දළුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දළුපිටිය ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න මහතා විසින් 2003.10.10 දින මැන සකස් කරන ලද අංක 311 ඒ/2003 දරන පිඹුරේ ප්‍රකාර ලොට් අංක ඒ දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම දෙකක් වූ (පර්. 11.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු මාර්ග අයිතිය ද වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක C 1019/33 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 නොවැම්බර් මස 21 වැනි දින පෙ. ව. 11.30** දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*මෙම වෙන්දේසිය COVID-19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.*

වැඩි විස්තර සඳහා 2015.03.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2015.03.02 වැනි දින ''දිනමිණ'' ඩේලි නිව්ස් හා තිනකරන් පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට මහනුවර දෙසට වන ප්‍රධාන මාර්ගය ඔස්සේ මහර හන්දිය දක්වා කි. මී. 14ක් පමණ ගොස් වම්පසට ඇති දළුපිටිය මාර්ගයට හැරී එම මාර්ගයේ කි. මී. 1.4ක් පමණ ඉදිරියට ගිය පසු මාර්ගයට යාබද ව ඔබගේ දකුණු අත පැත්තෙන් මෙම දේපළ දිස්වනු ඇත. (6 වන සැතපුම් කණුව පසුකර මීටර් 50ක් පමණ ගිය විට)

*ගෙවීමේ ක්‍රමය. -*

(01) ගැණුම් මිලෙන් 10ක්,
(02) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
(04) ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක්,
(05) විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල් ද,
(06) විකුණුම් සහතිකයට අදළ මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය 131, නුවර පාර, බැලුම්මහර මුදුන්ගොඩ යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 033-2223880, 2225008, 2226909
ෆැක්ස් අංකය : 033 2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇතිගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක 011 - 2053286/072 - 3207533, 076 - 9217329.

11-48

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ''ඩී'' වගන්තිය යටතේ යෝජනා සම්මතය

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ගල්කිස්ස ගම්සභා සීමාව තුළ, පමුණුව යන ගම පමුණුව පාරේ වරිපනම් අංක 96/1 (කොටසක්) දරන තැන පිහිටි ''ඔබවත්ත හෙවත් මිල්ලගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන මහතා විසින් 1984.03.21 දින මැන සාදන ලද අංක 1434 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 3 ඊ 2 දරන පර්චස් දහසයයි දශම හයයි බිංදුවක් (පර්. 16.60) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද වේ.

ඉහත කී පමුණුව යන ගම පමුණුව පාරේ පිහිටි ''ඔබවත්ත හෙවත් මිල්ලගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන මහතා විසින් 1984.03.12 දින මැන සාදන ලද අංක 1432 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 3 සී දරන පර්චස් දහතුනයි දශම හයයි බිංදුවක් (පර්. 13.60) ක් විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම් ද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2369/293 හා එම 3014/193 දරන පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ **2022 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30** ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*මෙම වෙන්දේසිය* COVID -19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*දේපලට පිවිසීම.-* මහරගම සිට පරණ පාර හරහා පමුණුව පාරේ කි. මී. 1.0ක් පමණ ගිය විට දකුණු පැත්තේ ඇති අඩි 10ක් පළල මිල්ලගහවත්ත පෙදෙස පාරේ මී. 100ක් පමණ ගිය විට එම පාරේ අවසානයේ මෙම දේපල පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2009.10.15 දිනැති ''දිනමිණ'' හා ඩේලි නිව්ස් පුවත්පත්වල පළ වූ වෙන්දේසි යෝජනාව සහ 2009.08.21 දින හා 2010.05.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළකල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවීම් කළ යුතු ය :

(01) ගැණුම් මිලෙන් 10ක්,

(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
(04) ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 4,000ක්,
(05) විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල් ද,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 117ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260, 4305863 -
ෆැක්ස් අංක : 2817737, 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ, අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 282/3, 5/2 මට්ටම,
කිංග්ස් විව් රෙසිඩන්ස්,
කෝට්ටේ පාර, නුගේගොඩ.
දුරකතන අංක 071- 8021206.

11-49/1

---

**මහජන බැංකුව - මොරටුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ''ඩී'' වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොරළවැල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොරළවැල්ල ගමෙහි පිහිටියාවූ ද, සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක 520215 දරන කැඩැස්තර සිතියමේ කලාප 02 හි පත්‍ර අංක 09 කැබලි අංක 0327 වශයෙන් දැක්වෙන පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි තුනයි නවයයි හයක (හෙක්. 0.0396) විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ වගාවන් හා එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ **2022 නොවැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.30 ට** දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.*

වැඩි විස්තර සඳහා.- 2021.09.03 දිනැති ''දිනමිණ'' සහ ''ඩේලි නිව්ස්'' හා තිනකරන් පුවත්පත්වල පළ වූ වෙන්දේසි යෝජනාව සහ 2021.09.03 දිනැති ගැසට් පත්‍රයේ පළ වූ යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*- මොරටුව නගරයේ (පරණ ගාලු පාරේ 19 වන සැතපුම් කණුව) සිට පානදුර දෙසට මොරටුව පොලිස් ස්ථානය හා ''ප්‍රනාන්දු පෙදෙස'' පසුකරමින්, පරණ ගාළු පාරේ මීටර් 425 ක් පමණ ගොස් මොරටුව පාලම අසල ඇති බුදු පිළිමය අසලින් කොරළවැල්ල පාරට (142 බස් මාර්ගය) පිවිස එම මාර්ගයේ මීටර් 700ක් පමණ කොරළවැල්ල පළමු පටුමග ද පසුකරමින් ගොස් දකුණු පසට ඇති අඩි 10ක් පළල බොරළු පාරට හැරී මීටර් 20ක් පමණ ගමන් කළ විට පාර අවසානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවීම් කළ යුතු යः-

(01) ගැණුම් මිලෙන් 10%ක්,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
(04) ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 4,000ක්,
(05) විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල් ද,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ අංක 117ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමණාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260, 4305863
ෆැක්ස් අංක : 2817737, 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින

30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 282/3, 5/2 මට්ටම,
කිංග්ස් විව් රෙසිඩන්ස්,
කෝට්ටේ පාර, නුගේගොඩ.
දුරකථන අංක 071- 8021206.

11-49/2

---

## ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල (ඩී. එෆ්. සී. සී. වර්ධන බැන්ක් පී. එල්. සී. හි අනුප්‍රාප්තික) ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් වන ආර්. ජේ. වන්නිආරච්චි විසින් ලියා සහතික කරන ලද 2015.03.20 දිනැති අංක 2351 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, ගාල්ලේ අහංගම මුණසිංහගේ සුජානි තිලංකා සඳමාලි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

01. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ඇතුළත අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිනිදුන්ගොඩ ග්‍රාම සේවා කොට්ඨාසයේ, අක්මීමන හාලිවල ගමේ පිහිටි ''ඇටඹගහවත්ත හෙවත් ගොඩේවත්ත'' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු යූ. වේවැල්වල විසින් සාදන ලද 2014.12.18 දිනැති අංක 2287 දරන පිඹුරේ දැක්වෙන ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හයයි දශම පහක් (රූ. 1, පර්. 6.5) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි පස, ගහකොළ වැවිලි ඇතුළු සියලු දේ වේ.

02. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ඇතුළත අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිනිදුන්ගොඩ ග්‍රාම සේවා කොට්ඨාසයේ, අක්මීමන හාලිවල ගමේ පිහිටි ''ඇටඹගහවත්ත හෙවත් ගොඩේවත්ත'' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඩී. රණවීර විසින් සාදන ලද 1998.07.23 දිනැති අංක 3341 දරන පිඹුරේ ලොට් 13 ඒ මතින් සහ ඔස්සේ ජලනල, විදුලි කම්බි සහ දුරකථන රැහැන් ඇදීමේ අයිතිය සහ මාර්ගයන් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ද සහිතව ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම පහයි බිංදුවක් (පර්. 2.50) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ.

ඉහත සඳහන් දේපළ **2022 නොවැම්බර් මස 29 වැනි දින පෙරවරු 11.30 ට** එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පලේ සිට ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගය දිගේ කි. මී. 2.5 ක පමණ දුරක් ගොස් සම්බෝධිය හංදිය දක්වා පැමිණ පම්පසට ඇති උඩුගම මාර්ගයට හැරෙන්න. එම උඩුගම මාර්ගය ඔස්සේ තවත් කි. මී. 2.9 ක පමණ දුරක් ගොස් විජයානන්ද මාවත දක්වා පැමිණ වම්පසට ඇති විජයානන්ද මාවතට හැරී තවත් මීටර් 150 ක පමණ දුරක් ඉදිරියට පැමිණි වට දේපලට පිවිසෙන මාර්ගය පාරේ වම්පසින් හමුවේ. එම මාර්ගයේ තවත් මීටර් 200 ක පමණ දුරක් ගිය විට ''රන්තිල් රිසෝට්'' නමැති අදාළ දේපළ මාර්ගය අවසානයේ පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස්වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2022.09.16 වැනි දින පළ වී ඇති අතර, ද අයිලන්ඩ්, දිවයින යන පුවත්පත්වල 2022.08.09 සහ තිනකුරල් පුවත්පතේ 2022.08.10 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලේ 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථනය 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකථන අංක : 011 - 3068185, 011- 2572940.

11-104

## ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල (ඩී. එෆ්. සී. සී. වර්ධන බැන්ක් පී. එල්. සී. හි අනුප්‍රාප්තික) සී ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන කේ. ඩී. ඒ. සී. අබේසේකර, සී. පී. ඩබ්ලිව්. මීගහවෙල, එන්. එස්. රණතුංග විසින් ලියා සහතික කරන ලද 2015.02.25, 2015.03.04 සහ 2015.03.11 දිනැති අංක 7313/944,968 ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. සී. අබේසේකර විසින් ලියා සහතික කරන ලද 2017.07.06 දිනැති අංක 8608 ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. සී. අබේසේකර විසින් ලියා සහතික කරන ලද 2019.01.02 දිනැති අංක 9273 සහ 9275 දරන උකස් බැඳුම්කරයන් මත අය විය යුතු ගෙවීම් කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද අංක 11641 දරන ලියාපදිංචි අංකය යටතේ පළාපත්වෙල සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නන්දසිරි හාර්ඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්ද,

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ, පළාපත්වෙල ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත මාතලේ දකුණ ගම්පහ සිය පත්තුවේ, කිරිගල්පොත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුගම පිහිටි ''ගෝනටුවෙවත්ත සහ ගෝනටුවේයාය හෙවත් ගොලුවැල්ලේහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද 2000.03.26 දිනැති අංක 1158 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1158 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් පහළොවයි දශම පහක් (අ. 3, පර්. 15.5) හෙවත් හෙක්ටයාර් 1.254ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ.

ඉහත සඳහන් දේපළ 2022 නොවැම්බර් මස 28 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - මාතලේ නුගගහ බස්නැවතුම්පොලේ සිට දඹුල්ල මාර්ගය ඔස්සේ කි. මී. 4.1 ක පමණ දුරක් ගිය විට හමුවන 31 වන කි. මී. කණුව ද, පසුකර මීටර් 40 ක පමණ දුරක් ගිය විට අදාල දේපළ මාර්ගයේ දකුණු පසින් (නන්දසිරි හාර්වෙයාර් එකට පෙර) පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කොවිඩ් - 19 උපදෙස්වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2022.08.05 වැනි දින පළ වී ඇති අතර, ද අයිලන්ඩ්, දිවයින යන පුවත්පත්වල 2022.06.17 සහ තිනකුරල් පුවත්පතේ 2022.06.20 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, (VAT) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න : අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථනය 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),<br>බලයලත් වෙන්දේසිකරු,<br>සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,<br>50/3, විහාර මාවත, කොලොන්නාව,<br>දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

11-105

---

## ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2018.05.01 දිනැති අංක 2069 දරන උකස් බැඳුම්කරය, 2018.05.01 දිනැති අංක 2071 සහ 2018.05.01 දිනැති අංක 2139 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම සිය ලියාපදිංචි කාර්යාලය ගාල්ලේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ PV 94230 දරන අංකයෙන් ලියාපදිංචි කරන ලද අබේවික්‍රම ෆුඩ් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්ද,

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ගාල්ල මහ නගර සභා බල සීමාව ඇතුළත මාඉට්පේ (101) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ,

මාඉටිපේ පිහිටි ගොන්නගහ ඕවිට හෙවත් ඇටියාගහ ලියැද්ද ඕවිටේ ඒකාබද්ධ කරන ලද ලොට් 2 සහ 3 හි ඒකාබද්ධ කරන ලද ලොට් A සහ C වලින් කොටසක 1 සහ ලොට් 1 ගොන්නගහ ඕවිට හෙවත් ඇටියාගහ ලියැද්ද ඕවිටේ ඒකාබද්ධ කරන ලද ලොට් 2 සහ 3 හි ලොට් A හි කොටසක් සඳහා බලයලත් මිනින්දෝරු ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් සාදන ලද 2010.09.18 දිනැති අංක 4043 දරන පිඹුරේ දක්වෙන ලොට් B 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 4043 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකක් (පර්. 8.2) ක් විශාල ඉඩම එහි පිහිටි පස, වැවිලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියා පදිංචි වී ඇත.

ඉහත සඳහන් දේපළ **2022 නොවැම්බර් මස 29 වැනි දින පෙරවරු 10.00** ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - ගාල්ල ප්‍රධාන බස්නැවතුම්පලේ සිට ගාල්ල - කරාපිටිය මාර්ගය ඔස්සේ (අම්බලන්වත්ත හරහා) කි. මී. 5.6 ක පමණ දුරක් ගිය විට පිහිටි ලබුදූව මංසන්ධියට මීටර් 15 කට පමණ පෙර අදාළ දේපළ මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කොවිඩ් - 19 උපදෙස්වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ* 2022.09.16 වැනි දින පළ වී ඇති අතර, ද අයිලන්ඩ්, දිවයින යන පුවත්පත්වල 2022.08.30 සහ තිනකුරල් පුවත්පතේ 2022.09.01 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථනය 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

11-106

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කිරිබත්ගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැදිමාල අංක 536 ග්‍රාම නිලධාරි වසමේ නැදිමාල හි පිහිටි ඇන්ඩර්සන් පාරේ වරිපනම් අංක 140/6, නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් 2002 සැප්තැම්බර් මස 04 වැනි දින මැන සාදන ලද අංක 787/2002 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් ඒ දරන

ප්‍රමාණය : පර්චස් දහතුනයි දශම පහයි බිංදුව (පර්. 13.50) විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ නුගේගොඩ, මිරිහාන ජොස්වෙල් පෙදෙසේ අංක 3/B, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ යුනියන් මේටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ ධනරාජ් රාමරත්නම් උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කර ඇත.

ඉහත සඳහන් දේපළ.- වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.00 ට

යෝජනා සම්මුතිය සඳහා 2018.08.17 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, සහ 2018.08.20 ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* කොළඹ සිට හයිලෙවල් පාර ඔස්සේ නුගේගොඩ හන්දියට පැමිණ එතැනින් දකුණට හැරී කලුබෝවිල රෝහල පාරෙන් (කොහුවල හරහා) වමට හැරී කිලෝමීටරයක් පමණ ගමන් කළ විට ඇන්ඩර්සන් පාර හමුවේ. එතැනින් දකුණට හැරී කනත්ත හමුවීමට කලින් මීටර් 100ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2000, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතුකල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කිරිබත්ගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක : 011- 2445393 - 011 - 2396520
ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 134, නුවර පාර,
කිරිබත්ගොඩ.
දුරකථන අංක : 011- 2909956 -7
ෆැක්ස් අංකය : 011- 2909955

11-107

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගන්දහයකෝරලේ කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟවට ප්‍රාදේශීය සභාවේ අම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත පල්ලේගම, අම්පිටිය හි පිහිටි ටිකිරිමලීගේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. ජයරත්න විසින් 2018 ජනවාරි 07 වැනි දින පිළියෙල කරන ලද අංක 1054 දරන පිඹුරෙන් මැන බෙද වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහසයයි දශම තුනයි බිංදුව (රූ. 1,ප ර්. 16.30) ක විශාල ඉඩම, V. V. අංක 236 දරන නිවස, ටැංකිය, ළිඳ සහ ''අම්පිටිය ඔටෝ කෙයා'' නමැති ව්‍යාපාරික ස්ථානය සමග එහි පිහිටි සියලු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 654/113 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 129, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තාවූ ද, PV 5757 දරන අංකය යටතේ ලියාපදිංචි වී ඇති සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ජේ. එන්. ඉන්ටීරියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් මහජන බැංකුවට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ

ඉහත සඳහන් දේපළ වර්ෂ **2022 ක්වූ දෙසැම්බර් මස 08 වැනි දින පෙ. ව. 10.30** ට අදළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩම වෙත පිවිසීම.* - නුවර නගර මධ්‍යයේ සිට අම්පිටිය පාර ඔස්සේ කිලෝමීටර් 4ක් පමණ ගමන් කළ විට එයට මායිම්ව වම් පැත්තේ පිහිටි විෂයගත දේපළ වෙත ළඟා විය හැක. (කිලෝමීටර් 3 කණුව පසුකර මීටර් 400ක් පමණ)

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ

දී අංක 75, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 - මහජන බැංකුව ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහල, උසාවි පාර,
කොළඹ 12.
දුරකථන අංක 011-2396520
ඊමේල් senaservice84@gmail.com

11-108

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - බණ්ඩාරවෙල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1 වන උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත කුඹල්වෙල කෝරළේ උඩු කුඹල්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩුකුඹල්වෙල ගමේ පිහිටි කුරකන්දුරේ පතන, ගැටඹගහඇල්ල පතන, හෙවත් අරඹගහඇල්ල පතන, ඇටඹගහඇල්ල පතන ලෙස නම් කොට හඳුන්වන ලබන බෙදා මායිම් නියම කරන ලද ඉඩම් කොටස සහ බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් 2011.02.27 වැනි දින පිළියෙල කරන ලද අංක BD/8990d දරන මිනුම් සැලැස්මේ ලොට් අංක 1 ලෙස දැක්වෙන එකී ඉඩම් කොටස.

ප්‍රමාණය රූඩ් දෙකක් (රූ. 2) ක හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි දෙකක් (හෙක්ටයාර් 0.202) විශාල ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2 වන උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බණ්ඩාරවෙල මහ නගර සභා සීමා තුළ G. N. Div. No. 67B බිඳුණුවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත මහ පළාත කෝරළේ, ඇත්තලපිටිය ගමේ පිහිටි ''සිල්වත්තම්බෙපතන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එන්. කිණිගම විසින් 2013.02.15 වැනි දින පිළියෙල කරන ලද අංක 0774 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටස

ප්‍රමාණය පර්චස් දහනවයක් (පර්. 19) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී අංක 0774 දරන පිඹුරේ ලොට් B (මීටර් 4ක් පළල පාර) මතින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් සහ එකී අංක 0774 දරන පිඹුරේ ලොට් D ලකුණු කරන ලද ළිඳ භාවිතා කරන්නට ඇති අයිතිය සහ අංක 0774 දරන පිඹුරේ ලොට් D උඩින් යටින් සහ දිගේ පයිප්ප නල මාර්ග සහ අනෙකුත් උපක්‍රම සහ පහසුකම් යෙදීමට ඇති අයිතිය සමග වේ.

පොතුවිල කංකානම්ලාගේ නන්දික සුමේධ පොතුවිල ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1 වන සහ 2 වන උපලේඛනවල සඳහන් දේපළ

**1 වන උපලේඛනය වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 9.30 ට ද,**

**2 වන උපලේඛනය වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.30 ට ද,**

ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.03.12 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* -

1 වන උපලේඛනය

බණ්ඩාරවෙල ප්‍රධාන ඔරලෝසු කණුව හංදියේ සිට බිඳුණුවැව හංදියට ළඟාවීමට කිලෝමීටර් 3ක් පමණ බදුල්ල පාර ඔස්සේ ගමන් කර මෙම හංදියේ සිට මීටර් 300ක් පමණ ලෙවෙන්රා හෝටලය දක්වා ගමන් කර අනතුරුව දකුණට හැරී මීරියගහ ලෝවර් පාර ඔස්සේ මීටර් 200ක් පමණ ගමන් කළ විට පාරේ වම් අත පැත්තේ පිහිටි මෙම දේපළ වෙත ළඟා විය හැක.

2 වන උපලේඛනය

බණ්ඩාරවෙල ප්‍රධාන ඔරලෝසු කණුව හංදියේ සිට බිඳුණුවැව හංදියට ළඟාවීමට කිලෝමීටර් 3ක් පමණ බදුල්ල පාර ඔස්සේ ගමන් කර මෙම හංදියේ සිට ඇත්තලපිටියට වමට හැරී මෙම පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් කළ විට පාරේ වම් අත පැත්තේ පිහිටි විෂයගත දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 3,500, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2000, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් අකාලීන වටිනාකම් බද්ද VAT ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බණ්ඩාරවෙල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011 - 2396520
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 393/G -1 බදුල්ල පාර,
බණ්ඩාරවෙල.
දුරකතන අංක : 057 - 2232653
ෆැක්ස් අංකය : 057 - 2232654

11-109

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - බලංගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1 වන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ. හෙළඋඩ පළාතේ, බලංගොඩ නාගරික සභා සීමා තුළ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කිරිදිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිරිදිගල පිහිටි වැවේකුඹුර හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් 2000.07.07 වන දින පිළියෙල කරන ලද අංක 8194 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ප්‍රමාණය පර්චස් පහයි දශම හයයි නවයක (පර්. 5.69) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2 වන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ නාගරික සභා සීමා ඇතුලත බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ G. N. Div. No. 260D ගොඩකුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත නැදුන්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද කැඩැස්තර සිතියමේ අංක 620047 තුළ දක්වෙන ඉඩම් කලාප අංක 35, දරන ප්‍රමාණය හෙක්ටයාර් බිංදුවයි දශම එකයි අටයි හතයි හය (හෙක්ටයාර් 0.1876) ක විශාල ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

4 වන උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ, හපුතලේ පාරේ, අංක 70 දරන ස්ථානයේ පරිශ්‍රය තුල සහ මත දැනට තිබෙන ණයකරුගේ කුමන හෝ සියලුම ශුද්ධ තොග වෙළඳ බඩු බාහිරාදිය සහ දේ, අනාගතයේ දී බලංගොඩ, හපුතලේ පාරේ අංක 70 දරන ස්ථානයට ගබඩා කළ හැකි මෝටර් සයිකල් සහ අමතර කොටස් සහ අනෙකුත් අයිතම තොග සහ එබඳු කුමන හෝ දේ සහ ණයකරු දැනට සිටින හෝ මින්මතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට ව්‍යාපාරය කරගෙන යා හැකි අනෙකුත් ගුදම් ගබඩාවන් හි සහ පරිශ්‍රයන් හි ඇති සහ

තබා ඇති හෝ කලින් කලට ගබඩා කරනු ලැබිය හැකි සහ තැබිය හැකි තොග වෙළඳ බඩු බාහිරා දිය සහ දේ ඇති සහ තබා ඇති සහ එසේම මින් මතු තවදුරටත් මෙම උකස පවත්වාගෙනයාම තුළ දී ඕනෑම අවස්ථාවක දී කලින් කලට ඉහත කී පරිශ්‍ර, ගුදම් හෝ ගබඩා මත ගබඩා කරන්නට හෝ තබා හෝ තියන්නට ගෙනෙනු ලබන සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අනෙකුත් ස්ථානයන්හි ව්‍යාපාරයේ සියලුම හෝ අනෙකුත් ස්ථානය හෝ ස්ථාන වෙතට ණයකරු ඕනෑම අවස්ථාවක දී මෙහි කළින් සඳහන් කරන ලද එකී තොග හෝ ගුදම් හි වාප්පු නිෂ්කාශන එහි ව්‍යාපාරය හෝ වෙළඳාම හෝ ගබඩාව මත ඉවත් කරන හෝ ගෙන යන මුළුමනින්ම වන තොග වෙළඳ බඩු සියල්ල වේ.

වීරවර්ධන නල්ලපෙරුම මුදියන්සේලාගේ ප්‍රේමරත්න බණ්ඩාර ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1, 2 සහ 4 වන උපලේඛනවල සඳහන් දේපළ.

**දෙවන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පෙ.ව . 10.00 ට ද,**

**පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.30 ට ද,**

**හතරවන උපලේඛනයේ සඳහන් දේපළ 2022 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින ප. ව. 1.00 ට ද,**

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.08.30 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත්වල පළ කර ඇත.

*පිවිසීම*.- පළමුවන උපලේඛනයට .- බලංගොඩ පොලිස් ස්ථානයේ සිට තෝරාගත් දේපළ දක්වා මීටර් 400 ක පමණ දුරක් හපුතලේ පාර ඔස්සේ ගමන් කරන්න. ''බලංගොඩ මෝටරස් නම් දරන මෙම දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*දෙවන උපලේඛනයට* .- බලංගොඩ නගරයේ සිට කල්තොට පාර ඔස්සේ කිලෝමීටර් 12.5ක් ගමන් කර ඉබුලමුල පාරට දකුණට හැරී පාරේ වම් අත පැත්තේ පිහිටි අදාළ දේපළ වෙත තවත් මීටර් 200ක් පමණ ගමන් කරන්න.

*හතරවන උපලේඛනයට* .- බලංගොඩ නගර මධ්‍යයේ සිට (ඔරලෝසු කණුව) මුගුනමලේ පාර දක්වා අතුරු මගේ මීටර් 500ක් පමණ ගමන් කර පාරේ දකුණු අත පැත්තේ පිහිටි අදළ දේපළ දක්වා තවත් මීටර් 100ක් ගමන් කරන්න.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතුකල වටිනාකම් බද්ද VAT ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකථන : 011- 2445393 - 011 - 2396520
ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 27,
හපුතලේ පාර,
බලංගොඩ.
දුරකථන අංක : 045 - 2286719
ෆැක්ස් අංකය : 045 - 2286700

11-110

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරළේ පල්ලේ පත්තුවේ පැලියගොඩ නගර සභා සීමාව තුළ කැලණිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලියදොර වත්ත ග්‍රාම නිලධාරි වසමේ පැලියගොඩ පිහිටි පැලියගොඩ මීගමුව පාරේ වරිපනම් අංක 399 දරන ''හල්ගහවත්ත, තුකුරුගේවත්ත, පයුරුගහවත්ත සහ අට්ටික්කාගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් මැන සාදන ලද අංක 3274 A සහ 2014 අප්‍රේල් මස 09 වැනි දින දරන පිඹුරේ නිරූපිත (බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් මැන සාදන ලද අංක 6003 සහ 1994 ඔක්තෝබර් මස 02 වැනි දින දරන පිඹුරේ නිරූපිත ඒකාබද්ධ කළ ලොට් B2A, B2B සහ B2C දරන ඉඩම් කැබලිවල නැවත මැන අනුබෙදීමක් වන) ලොට් 01 දරන බෙද වෙන් කළ බිම් කොටස

ප්‍රමාණය පර්චස් දාහතකුත් දශම එකයි නවයක් (පර්. 17.19) හෙවත් හෙක්ටයාර් 0.0435 විශාල ඉඩම් කැබැල්ල සහ එහි ගොඩනැගිලි ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, පල්ලේ පත්තුවේ, පැලියගොඩ නගර සභා සීමාව තුළ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලියදොරවත්ත ග්‍රාම නිලධාරි වසමේ පැලියගොඩ පිහිටි පැලියගොඩ මීගමුව පාරේ වරිපනම් අංක 399 දරන ''හල්ගහවත්ත, තුකුරුගේවත්ත, පයුරුගහවත්ත සහ අට්ටික්කාගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් මැන සාදන ලද අංක 3274 ඒ සහ 2014 අප්‍රේල් මස 09 වැනි දින දරන පිඹුරේ නිරූපිත (බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් මැන සාදන ලද අංක 6003 සහ 1994 ඔක්තෝබර් මස 02 දින දරන පිඹුරේ නිරූපිත ඒකාබද්ධ කළ ලොට් අංක B2A, B2B සහ B2C දරන ඉඩම් කැබලිවල නැවත මැන අනුබෙදීමක් වන) ලොට් 02 දරන බෙද වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් බින්දුවයි දෙකයි දශම හතයි පහක් (පර්. 02.75) හෙවත් හෙක්ටයාර් 0.0069 විශාල ඉඩම් කැබැල්ල සහ එහි ගොඩනැගිලි ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

ප්‍රසිද්ධ නොතාරිස් පී. බී. යූ. එස්. බස්නායක විසින් සහතික කරන ලද අංක 316 සහ 2019.05.06 දින දරන උකස් බැඳුම්කරය මගින්. ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස් කොට ඇපයට තබන ලද මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/ණය පහසුකම් ගෙවා පියවා දැමීම, කොළඹ 15 පදිංචි දොන් සුදත් ලසන්ත ප්‍රදීප්කුමාර විජේසිංහ (පළමුවන ණය ගැණුම්කරු) සහ කොළඹ 15 සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ලියාපදිංචි අංක PV 68241 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන එස්. බී. සී. ඒසියා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (දෙවන ණයගැණුම්කරු) විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිකරු වන එකී පළමුවන ණය ගැණුම්කරු විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 316 දරන බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද, ඒ අනුව, 2020 නොවැම්බර් මස 17 වැනි දිනට එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද, නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව,

ඉහත සඳහන් දේපළ (ලොට් 01 සහ ලොට් 02) **වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින ප. ව. 1.00** ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කටුනායක අධිවේගී මාර්ගයේ පැලියගොඩ අන්තර හුවමාරුව අසලින් සම්බන්ධිත පාරක් ඔස්සේ මීගස්වත්ත පාර දෙසට මීටර් 700 ක පමණ දුරක් ගමන් කර මීගමුව පාරට ළඟාවී මෙතැනින් මීගමුව පාරට වමට හැරී මීටර් 400 සිට 450 ක පමණ දුරක් ගමන් කළ විට සම්පූර්ණයෙන් ම පාහේ කාගිල්ස් ෆුඩ් සිටි විරුද්ධව දකුණු අත පැත්තේ පිහිටි විෂය ගත දේපළ වෙත ළඟා විය හැක. මෙම ඉඩමේ පසුපස කොටස කැළණි ගඟට මායිම්ව ඇත. ඉතා පහසුවෙන් හඳුනාගත හැකි මෙම දේපළ පැලියගොඩ, මීගමුව පාරේ, වරිපනම් අංක 399 දරන තැන වේ.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. හි තැන්පත් කළ යුතු ය.
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහල හල්ස්ඩෝර්ෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 0112- 445393

කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.
අංක 40, නවම් මාවත,
කොළඹ 02.
දුරකතන අංක 011- 2448448.

11-111

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - බත්තරමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුළත මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 529 පොල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දෙපානම, බොරැල්ල පාරේ, වරිපනම් අංක 300A දරන ස්ථානයේ පිහිටි එරියගහකුඹුර හෙවත් මූණමල්ගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් 2009 මැයි 27 වැනි දින පිළියෙල කරන ලද අංක 1750 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් Z 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් තිස් අටයි දශම අටයි බිංදුව (පර්. 38.80) ක හෙවත් හෙක්ටයාර් 0.0981 ක විශාල ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත බත්තරමුල්ල, තලංගම දකුණ, පහළවෙල පාරේ, අංක 912/A දරන ස්ථානයේ ජේ ලංකා ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රය තුළ සහ මත දැනට වැතිර තිබෙන කුමන හෝ චංචල දේපළ සහ සෝලාර් පැනෙලස්, පවර් ඔප්ටිමයිසර්ස් ඉන්වර්ටර්ස් සහ සෝලාර් පැනෙල් සිස්ටම් එකට අදළ අනෙකුත් කොටස් හි සියලුම තොග බඩු ඇතුළත් කුමන හෝ සියලුම ශුද්ධ තොග වෙළඳ බඩු බාහිරාදිය සහ අනෙකුත් චංචල දේපළ සහ දේ හෝ මින්මතු මේවා තවදුරටත් පවත්වාගෙන යාම තුළ දී ඕනෑම අවස්ථාවක කලින් කලට ගෙන එනු ලබන හෝ ගෙන එනු ලැබිය හැකි සහ/හෝ ණයකරු ඕනෑම අවස්ථාවක දැනට සිටින හෝ සිටිය හැකි සහ මින් මතු කලින් කලට ව්‍යාපාර කරගෙන යා හැකි අනෙකුත් ගුදම්, ගබඩා හෝ පරිශ්‍රයන් තුළ සහ මත ගබඩා කොට තබා තියන්නට ගෙන එනු ලබන තොග වෙළඳ බඩු හි සමස්ථය සහ ඉහත සඳහන් කරන ලද අයිතම ඇතුළත් ණයකරුගේ කුමන හෝ දේ සහ ණයකරු ගබඩා කොට තබන්න ඉඩ ඇති ණයකරුගේ කුමන හෝ අනෙකුත් චංචල දේපළ සියල්ල මුළුමනින් ම වේ.

සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන බත්තරමුල්ල, තලංගම දකුණ, පහළවෙල පාරේ අංක 912/A දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ජේ ලංකා ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ සහ දෙවන උපලේඛනයේ සඳහන් වෙළඳ තොග බඩු සහ අනෙකුත් චංචල දේපළ

**දෙවන උපලේඛනය - වෙළඳ තොග බඩු**

**වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.00 ට**

**පළමුවන උපලේඛනය - ලොට් X 2**

**වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 23 වැනි දින ප. ව. 12.30 ට**

**ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

යෝජනා සම්මුතිය සඳහා 2021.08.06 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.08.06 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* -

*1 වන උපලේඛනය .-*

පන්නිපිටිය සිට බොරැල්ල පාර ඔස්සේ තලවතුගොඩ දෙසට කිලෝමීටර් 1.5 ක පමණ දුරක් ගමන් කළ විට පාරේ විරුද්ධ පැත්තේ ඉන්ධන පිරවුම්හල අසළ සහ ප්‍රධාන පාරේ දකුණු අත පැත්තට යාබදව පිහිටි දේපළ වෙත ළඟා විය හැක.

*2 වන උපලේඛනය .-*

බත්තරමුල්ල, තලංගම දකුණ, පහළවෙල පාරේ අංක 912/A දරන ස්ථානයේ ජේ ලංකා ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් අකාලීත වටිනාකම බද්ද VAT ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බත්තරමුල්ල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011- 2445393 - 011 - 2396520
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 213, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

දුරකතන අංක : 011- 2887977,
ෆැක්ස් අංකය : 011- 2867521.

11-112

---

**අමානා බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය 1 වන දේපළ**

බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් සාදන ලද 2013 අප්‍රේල් මස 29 වැනි දින අංක 5504 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තාවූ ද, වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දාන් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හලාවත මහනගර සභා සීමාවේ, ඉච්චම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉච්චම්පිටිය කොට්ඨාස අංක 02, ඉච්චම්පිටිය ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ඉච්චම්පිටිය එස්ටේට් හෙවත් සිංහපුර එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන්නාවූ හලාවත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 11/110 දරන හිමිකම් කොට්ඨාසය/පත්තිරුව/වෙලුම යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඒකාබද්ධ ඉඩම් කොටස වේ.

ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම නවයයි පහක් වූ ද (පර්. 32.95) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

මේ යටතේ විස්තර කර ඇති ඉඩම හරහා සහ ඒ ඔස්සේ යාම ඒමේ මාර්ග අයිතිය ද ඊට ඇතුළත් වේ එනම් ප්‍රමාණයෙන් පර්චස් විසි හතයි දශම පහක් වූ ද (පර්. 27.05) බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 10 වැනි දින අංක 2005/363 බී දරන පිඹුරේ ලොට් R 10 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තාවූ ද, (අඩි තිහක් පළල පාරක් සඳහා වෙන්කල කොටස) වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ ආනවිලුන්දාන් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හලාවත මහ නගර සභා සීමාවේ, ඉච්චම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉච්චම්පිටිය අංක 02 දරන කොට්ඨාසයේ, ඉච්චම්පිටිය ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ඉච්චම්පිටිය එස්ටේට් හෙවත් සිංහපුර එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද හලාවත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A 11/101 දරන හිමිකම් කොට්ඨාසය/වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී බෙදා වෙන් කළ ඒකාබද්ධ ඉඩම් කොටස වේ.

තවද, පහත සඳහන් ඉඩම් කොටස් හරහා සහ ඒ ඔස්සේ යෑමේ ඒමේ මාර්ග අයිතිය ද ඊට ඇතුළත් වේ. එනම් : (1) එක එස් අංක 205/253 B දරන පිඹුරේ ලොට් අංක R1, R6 සහ R11 දරන ඉඩම් කොටස් (2) බලයලත් මිනින්දෝරු එම්. එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් සාදන ලද 1998.11.20 වැනි දින අංක 2963 දරන පිඹුරේ සඳහන් ලොට් අංක R1, R3 සහ R6 දරන ඉඩම් කොටස්.

**2 වන දේපළ**

හලාවත බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද 2014.04.29 වැනි දින අංක 5786 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තාවූ ද, වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්පිටිය කොට්ඨාසයේ දකුණු කිල් අක්කරෙයිපත්තුවේ - අන්ඩිමුනෙයි ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, පුත්තලම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C 37/23 දරන හිමිකම් /කොට්ඨාසය/වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

ප්‍රමාණයෙන් අක්කර දාහතයි පර්චස් තිස් එකයි දශම පහක් (අ. 17, පර්. 31.5) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. එම්. බී. අමීන් විසින් සහතික කරන ලද 1018 අප්‍රේල් මස 02 වැනි දින අංක 14342 දරන ප්‍රාථමික උකස් බැඳුම්කර මත ද, අංක 14344 දරන තවත් ප්‍රාථමික උකස් බැඳුම්කරයන් මත ද, අංක 14346 දරන ද්විතීය උකස් බැඳුම්කර මත ද, මෙහි ඉහත පළමු සහ දෙවන උපලේඛනවල සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍ර ''කින් ඇක්වා සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ආයතනය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායි ලෙස සහ උකස්කරු ලෙස ක්‍රියාකරමින් එකී ''කින් ඇක්වා සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' යන ආයතනය විසින් කොළඹ 03, ගාළු පාර, අංක 486, දරන ස්ථානයේ පිහිටි අමානා බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කර මගින් ඇප තබන ලද අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය ඉහත කී මූල්‍ය පහසුකම් මත ආපසු ගෙවීම් ඉහත කී ''කින් ඇක්වා

සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ආයතනය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, අමානා බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

2 වන උපලේඛනයේ දක්වෙන දේපළ වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින පෙ. ව. 11.30 ට ත් 1 වන උපලේඛනයේ දක්වෙන දේපළ වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින ප. ව. 1.30 ටත් අදාළ දේපළ පිහිටි ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනයේ සඳහන් 1 වන දේපළවලට පිවිසීම. -**

හලාවත නගරයේ ප්‍රධාන වටරවුම අසල සිට වාරියපොළ පාර ඔස්සේ මීටර් 200ක් ඉදිරියට ගමක් කර දකුණු පැත්තේ ඇති පල්ලිය දක්වා පැමිණ සිංහපුර පාරට වමට හැරෙන්න. පල්ලියට විරුද්ධ පැත්තේ පාර, එම පාරේ මීටර් 300ක් ගමන් කරන විට කින් ඇක්වා සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් දේපළ දකුණු පැත්තේ පිහිටා ඇති අතර එම දේපළට පෙර, දකුණු අතට ඇති සිංහපුර නිවාස සංකීර්ණයට ගමන් කරන පාරට හැරී මීටර් 150ක් ගමන් කර දකුණට හැරෙන්න. නැවත දකුණු අතට ඇති 6 වැනි පටුමගට හැරී මීටර් 35ක් ගමන් කරන්න. මෙම දේපළ දෙවන අදියරේ දකුණු අත පැත්තට වන්නට අංක 214/57 ස්ථානයේ පිහිටා ඇත.

**උපලේඛනයේ සඳහන් 2 වන දේපළවලට පිවිසීම. -**

පුත්තලම් නගරයේ සිට කොළඹ පාරේ කිලෝමීටර් 32.2ක් පමණ දුරින් ඇති බත්තුලුඔය දක්වා ගමන් කරන්න. බත්තුලුඔය දුම්රිය ස්ථානයට පෙර, උඩප්පු පාරට දකුණට හැරී උඩප්පු වීරපත්‍ර කාලි අම්මාන් කෝවිල් හන්දිය දක්වා කිලෝමීටර් 5.5 පමණ ඉදිරියට ගමන් කරන්න. එතන සිට ඉදිරියට අනඩිමුනෙයි පාරේ කිලෝමීටර් 3ක් පමණ ගමන් කරන විට පාරේ දකුණු පස ඇති අංක K 112 දරන ට්‍රාන්ස්ෆෝමරය දක්වා පැමිණෙන්න. එතැන සිට කලපුවට යන පාරට දකුණට හැරී මීටර් 400ක් පමණ ඉදිරියට ගමන් කරන විට මෙම දේපළ පාරේ වම් පසින් පිහිටා ඇති අතර එම දේපළ ඉදිරිපස ''කින් ඇක්වා සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්'' ලෙස නම් කර ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත අමානා බැන්ක් පී. එල්. සී. හි තැන්පත් කළ යුතු ය.
(03) පළාත් පාලන අයබදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 0112- 396520.

අයකිරීම් අංශය,
අමානා බැන්ක් පී. එල්. සී.
අංක 486, ගාළු පාර,
කොළඹ 03.
දුරකතන අංක 011- 5238370 යොමුව : 2112.

11-113

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - බලංගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**1 වන උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළයේ, තලපිටගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත මුත්තෙට්ටුවෙගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුත්තෙට්ටුවෙගම පිහිටි ''දෙයියන්නේ කුඹුරෙගොඩ'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බන්දුසේන විමලධර්ම විසින් 017.09.28 වැනි දින පිළියෙල කරන ලද අංක 1856 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටස

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් එක (රූ. 01, පර්. 01) ක හෙවත් (හෙක්ටයාර් 0.1037) ක විශාල ඉඩම සමග එහි පිහිටි හෝ ඊට අනුබද්ධ සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

01 වන දේපළ. - සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ නාගරික සභා සීමා තුළ මැද කෝරළයේ, හෙළඋඩ පළාතේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුඹගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කිරිඳිගල ගමේ මීගොඩ පිහිටි ''අස්වැද්දුම වත්ත''නමැති බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් විසින් 1998.10.27 වැනි දින පිළියෙල කරන ලද අංක 6869/A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් හයක් (පර්. 6) විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

*2 වන දේපළ.*- ඉහත කී පරිදි පිහිටි බෙදා වෙන් කරන ලද ''අස්වැද්දුම වත්ත'' ලෙස නම්කොට හඳුන්වනු ලබන ලොට් 05 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් හතරයි දශම එකක් (පර්. 04.1) විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

*03 වන දේපළ.* - ඉහත කී පරිදි පිහිටි ''අස්වැද්දුම වත්ත'' හි උතුරු මායිමට කිට්ටු බෙදන ලද කොටස ලෙස නම්කොට හඳුන්වනු ලබන බෙද වෙන්කරන ලද ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් දෙකයි දශම පහක් (පර්. 2.5) විශාල වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

බලංගොඩ, කිරිඳිගල පාරේ අංක 258 දරන ස්ථානයේ තුසේ පෙරේරා ලියනරාළලාගේ ජුඩ් හර්මන් කැමිලස් පෙරේරා ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කරන ලද ඉහත උපලේඛනවල සඳහන් දේපල

**1 වන උපලේඛනය - වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 30 වැනි දින ප. ව. 1.30ටත්**
**2 වන උපලේඛනය - වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 30 වැනි දින ප.ව. 3.00 ටත්**

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.10.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රය ද,* 2021.11.03 වැනි දින දිවයින, ඩේලිනිව්ස් සහ විරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම*

**1 වන උපලේඛනය**

බලංගොඩ නගරයේ සිට හපුතලේ පාර ඔස්සේ කිලෝ මීටර් 17 ක පමණ දුරක් ගමන් කර පඹහින්න හංදිය දක්වා පැමිණ අනතුරුව විශ්වවිද්‍යාල පාර ඔස්සේ මීටර් 100ක් පමණ ගමන් කර නැවත වමට හැරී මෝටර් රථ ප්‍රවේශ විය හැකි පාර ඔස්සේ දකුණු අත පැත්තේ ප්‍රවේශ පාර දක්වා කිලෝමීටරයක් පමණ ගමන් කර (දේශක වල්ගමගේ නිවසට යාබදව) අනතුරුව මෙම ප්‍රවේශ පාර ඔස්සේ අදාළ දේපළ දක්වා මීටර් 30ක් පමණ ගමන් කළ විට විෂයගත ඉඩම දකුණු අත පැත්තේ පිහිටා ඇත.

**2 වන උපලේඛනය**

බලංගොඩ නගරයේ සිට හපුතලේ පාර ඔස්සේ මීටර් 900ක් පමණ ගමන් කළ විට හපුතලේ පාරේ, වරිපනම් අංක 258 දරන පාරේ දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 3,500, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතුකල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර,
කොළඹ 12.
දුරකථන අංකඃ 011- 2445393 - 011 - 2396520
ෆැක්ස් අංක : 011- 2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 195, රත්නපුර පාර,
බලංගොඩ.

දුරකථන අංක : 045 - 2286719
ෆැක්ස් අංකය : 045 - 2286700

11-114

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී **වර්ෂ 2022 ක්වූ නොවැම්බර් මස 30 වැනි දින පෙරවරු 10.30 ට** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැදිරට කෝරළේ, බුත්තල, දොඹගහවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දොඹගහවෙල ගමෙහි පිහිටා ඇති ''හෙරලිගස් යාය'' හෙවත් හෙරලිගස් ලන්ද'' නමැති ඉඩම F. V. P. 602 හි කැබලි අංක 41 ලෙස දැක්වෙන සහ ඇති ඉඩමෙහි කෙටසක් වන බලයලත් මිනින්දෝරු බී. ජී. සී. පුෂ්පකුමාර මහතා විසින් මැන සාදන ලද වර්ෂ 2014.10.14 වැනි දිනැති අංක 6214 දරන පිඹුරෙහි කැබලි අංක 01 යනුවෙන් දැක්වෙන (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විල්මට් සිල්වා මහතා විසින් මැන සාදන ලද වර්ෂ 1993.01.07 වැනි දිනැති අංක 452 දරන පිඹුරෙහි කැබලි අංක 01) ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැවිලි ඇතුලු සියලු දෙය වේ.

විශාලත්වය : අක් 01, පර්. 15.2

*ඉහත කී දේපළට පිවිසෙන මාර්ගය .-* මොණරාගල නගරයේ සිට (වැල්ලවාය පාර හන්දිය) පොතුවිල් පාර දිගේ කිලෝමීටර් 18.5 ක පමණ දුරක් ගමන් කර දොඹගහවෙල කඩ වීදියට කිලෝමීටරයක පමණ ප්‍රථමයෙන් වම් පසින් විෂයගත දේපළ පිහිටා ඇත.

වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් එල්. කේ. අජිත් කුමාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.02.18 වැනි දිනැති අංක 925 දරන ප්‍රාථමික උකස්කරය, වර්ෂ 2015.09.16 වැනි දිනැති අංක 1174 දරන ද්විතීක උකස්කරය සහ වර්ෂ 2016.06.08 දිනැති අංක 1534 දරන අතිරේක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම දෙනගම විතානගේ ප්‍රදීප් සුදර්ශණ හේරත් මුදියන්සේලාගේ සුරංගිකා දීපානි හේරත්, දෙනගම විතාරණගේ සුසන්ත නිරෝෂණ සහ අබේධීර සීන පටබැඳිගේ කරුණාවතී යන අය ''බන්ධනදයින්'' සහ දෙනගම විතාරණගේ සුසන්ත නිරෝෂණ යන අය ''උකස්කරු'' වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* - 2022 ක් වූ ජුනි මස 10 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, දි අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුක් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුව ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කරගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667218/011-4667130

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3) විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 - 3068185, 011- 2572940.

11-115

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

### 1 වන වෙන්දේසිය

### කෙන්ගල්ල මහනුවර පාරේ පිහිටා ඇති පර්චස් 32 විශාලැති අගනා වානිජ පරිශ්‍රයක්

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර උඩුගම්පහ කෝරළේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙන්ගල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ''අළංගවත්ත නොහොත් ගොඩමඩිත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තැව විසින් 2010 ජූලි මස 04 වැනි

දින මැන සකස් කරන ලද අංක 4326 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 3 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් ජේ. තිලකරත්න විසින් සහතික කරන ලද්දවූ ද, DFCC Bank PLC (Successor to DFCC Vardhanan Bank PLC) නමට ලියන ලද්දවූ ද 2017 පෙබරවාරි මස 9 වැනි දින සහතික කරන ලද අංක 1193 දරන බැඳුම්කරයත් මත අයවිය යුතු මුදල ගෙවීමට ''N N Printers'' යන නාමය විලාසය සහ ආයතනය නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මන්තිළක මුදියන්සේලාගේ නෙර්මලා නිශාන්ති මන්තිළක ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ **2022 ක්වූ දෙසැම්බර් මස 02 වැනි දින ප. ව. 1.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* දිගන මඩවල මංසන්ධියේ සිට මහනුවර පාර ඔස්සේ කි. මී. 2ක් පමණ ගමන් කිරීමෙන් පාරට මායිම්ව පාරේ වම් පසින් ''එන් එන් ප්‍රින්ටර්ස්'' පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සදහා මුද්දර බදුද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

### 2 වන වෙන්දේසිය

කෙන්ගල්ල - මහනුවර පාරේ වරිපනම් අංක 90/3 දරන පරිශ්‍රයේ ගබඩා කර අති සහ/හෝ තබා ඇති අංග සම්පූර්ණ මුද්‍රණාලයක් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරලේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙන්ගල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි "අලංගවත්ත නොහොත් ගොඩමඩිත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් සාදන ලද 2010 ජූලි මස 04 දින මැන සකස් කරන ලද අංක 4326 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 3 දරන ඉඩම් කැබැල්ල.

පහත සඳහන් සියලුම යන්ත්‍රෝපකරණ (1) Colour Offset Machine - Heidelberg, Model - KORD - Gray, Reconditioned, 1977, Serial No. 352931, Country of Origin - West Germany 1 Unit, (2) Colour Offset Machine - Heidelberg, Model - KORD - Black, Reconditioned, Serial No. 333098, Country of Origin - West Germany 1 Unit, (3) Colour Offset Machine - Heidelberg, Model - SORD - Reconditioned, Serial No. 579685, Country of Origin - West Germany 1 Unit, (4) Two Colour Offset Machine - Heidelberg, Model - SORD - Z 1986, Reconditioned, Serial No. 523821, Country of Origin - West Germany 1 Unit, (5) Two Colour Offset Machine - Heidelberg, Model - Schneider, Serial No. 44272, Country of Origin - West Germany 1 Unit, (6) Two colour offset Machine - Heidelberg, Model- Polar MOHR , Serial No. 5531852, Country of Origin - West Germany 1 Unit (7) Die Cutting Machine - Heidelberg, Reconditioned, Serial No. SBB29354, Country of Origin - West Germany 1 Unit, (8) Pasting Machin, Tokyo Hoso Hikai Co. - Reconditioned, Serial No. 0676, Country of Origin - Japan (9) Collator Machine, Horizon International - Reconditioned, 1 Unit, (10) Binding Machine, Perfect Binding, Horizon International - Reconditioned, Model BQ440, Serial No. 102011 Country of Origin - Japan (11) Stapler Machine, EP Rosback Co. Model - Reconditioned, Serial No. 202571637DS, (12) Laminating Machine, EP Rosback Co. Model, Reconditioned, Serial No. N/ A, Country of Origin - India (13) Duplo Machine, RISO RZ 390 UI, Serial No. N/ A, Country of Origin - Japan.

ප්‍රසිද්ධ නොතාරිස් ජේ. තිලකරත්න විසින් සහතික කරන ලද්දවූ ද, DFCC Bank PLC (Successor to DFCC Vardhanan Bank PLC) නමට ලියන ලද්දවූ ද, 2017 පෙබරවාරි මස 9 වැනි දින සහතික කරන ලද අංක 1195 දරන බැඳුම්කරයත් මත අයවිය යුතු මුදල ගෙවීමට ''N N Printers'' යන නාමය විලාශය සහ ආයතනය නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මන්තිළක මුදියන්සේලාගේ නෙර්මලා නිශාන්ති මන්තිළක ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ සහ යන්ත්‍රෝපකරණ **2022 ක් වූ දෙසැම්බර් මස 2 වැනි දින ප. ව. 2.00** යන්ත්‍රෝපකරණ තබා ඇති ඉහත සඳහන් ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි දුර විස්තර සඳහා 2022.09.16 දින ශ්‍රී ලංකාආණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2022.08.09 වැනි දින ''දි අයිලන්ඩ්'' ''දිවයින'' සහ 2022.08.09 සහ 2022.08.10 වැනි දින ''තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

*යන්ත්‍ර තබා ඇති ස්ථානයට ප්‍රවිශ්ඨ වන මාර්ගය. -* දිගන මඩවල මංසන්ධියේ සිට මහනුවර පාර ඔස්සේ කි. මී. 2ක් පමණ ගමන් කිරීමෙන් පාරට මායිම් ව පාරේ වම් පසින් ''එන් එන් ප්‍රින්ටර්ස්'' පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) සම්පූර්ණ ගැණුම් මුදල ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සදහා මුද්දර බදුද වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හා ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී ණය පුණරුත්ථාපන සහ අයකිරීමේ ගෙන් විමසන්න.

දුරකථන අංක 011- 2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

11-127

---

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්පාර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අම්පාර පදිංචි එදිරිවීර ආරච්චිගේ ශාන්ත වික්‍රමසේකර යන අය බැඳුම්කරු/ උකස්කරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් H. M. S. ගුණරත්න විසින් සහතික කරන ලද 2015.03.12 දිනැති බැඳුම්කර අංක 230 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපල, **වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව කොළඹ 03, ගාලු පාර, අංක 90 හි පිහිටි සෙලාන් බැංකුව පීඑල්සී පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*උපලේඛනය*

01 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගන්දහය කෝරළේ ගඟවට කෝරළේ සහ මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය සභා සීමාව තුළ අම්පිටිය ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසය තුළ තැන්නේකුඹුර පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඉන්ද්‍රානි මල්ලිකා විසින් සාදන ලද 2014.11.08 දිනැති අංක 1940 සැලැස්මේ නිරූපනය වන තැන්නේකුඹුර එස්ටේට් හි කොටසක් නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඒ. එස්. එම්. අස්වාඩ් විසින් සාදන ලද 1990 සැප්තැම්බර් 03 දිනැති අංක 1324 සැලැස්මේ සඳහන් ලොට් 1 හි කොටස) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0: රූ. 0: පර්. 20) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

02 මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ගන්දහය කෝරළේ ගඟවට කෝරළේ සහ මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය සභා සීමාව තුළ අම්පිටිය ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසය තුළ තැන්නේකුඹුර පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඉන්ද්‍රානි මල්ලිකා විසින් සාදන ලද 2014.11.08 දිනැති අංක 1941 සැලැස්මේ නිරූපනය වන තැන්නේකුඹුර එස්ටේට් හි කොටසක් නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහසයයි (අ. 0: රූ. 0: පර්. 16) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - මහනුවර - මහියංගනය පාරෙන් තැන්නේකුඹුර පන්සල දක්වා පැමිණ එතැන් සිට තවත් මීටර් 270ක් පැමිණි පසු, වම් පසින් වන්නට මහියංගනය - මහනුවර පාරට ප්‍රවේශය සහිතව මෙම දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.- 2020.01.24 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* ද, ඩේලි FT, අද පුවත්පත්හි 2019.10.12 දින ද තිනක්කුරල් පුවත්පතෙහි 2020.10.09 බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පලාත් අධිකාරි බදු සඳහා 1% (සියයට එකක) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5% ද, 4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500ක් ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ද, 6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනුවක් (90%)ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී නීති - සෙලාන් බැංකුව පී. එල්. සී., අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 2456473, 011- 2456489.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 9, අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක : 071 - 4318252, 011 - 2173282.

11 - 133

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පන්නල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පන්නල පදිංචි රත්නායක මුදියන්සේලාගේ සුමිත් සුරංග යන අය බන්ධනදායී/ උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් D. V. D. R. අංගම්මන විසින් සහතික කරන ලද 2018.01.09 දිනැති උකස් බැඳුම්කර අංක 6579 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ **2022 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින පෙ. ව. 11.00ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව කොළඹ 03, ගාලු පාර, අංක 90 හි පිහිටි සෙලාන් බැංකුව පීඑල්සී පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ඉහළ ගලයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගලයාය පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද අංක 420544 කැඩැස්තර සැලැස්මේ වෝඩ් අංක 06 හි සඳහන් බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස් අංක 0228 සහ එකී හිමිකම් සහතික අංක 00212506612 අනුව ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0518 ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - පන්නල නගරයේ සිට මීගමු පාර ඔස්සේ මීටර් 200ක් පමණ දුරින් ඇති සම්පත් බැංකුව පරිශ්‍රය දක්වා පැමිණ එතැනින් දකුණින් ඇති පාරෙන් මීටර් 50ක් ගියපසු දකුණු පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* 2022.10.07 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද, *අරුණ,* ද *අයිලන්ඩ්* සහ *තමිලන්* පුවත්පත්හි 2022.10.12 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පලාත් අධිකාරි බදු සඳහා 1% (සියයට එකක) ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5% ද, 4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500ක් ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ද, 6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය ද වේ.

ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම හා වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. - සහකාර සාමාන්‍යාධිකාරිනී නීති - 14 මහල, සෙලාන් බැංකුව පී. එල්. සී., අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 2456475, 011- 2456479.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 9 - අයි හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමගම.
දුරකථන අංක : 071 - 4318252, 011 - 2173282.

11 - 134

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බ්ලූ ඕෂන් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0017 1000 9704.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2021.02.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අට කෝටි තිස් හය ලක්ෂ හැට දෙදහස් හාරසිය තුනයි ශත තුනක (රු. 83,662,403.03) මුදල ද, 2021 පෙබරවාරි 03 දින සිට අංක 1330 සහ 1177 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටියක (රු. 60,000,000.00) මුදලක් සඳහා At the rate of Average Weighted Prime Lending Rate + Four Decimal Five Per centum සියයට හතරයි දශම පහක් (AWPLR + 4.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2022.09.09 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2022.08.31 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**1 වන උපලේඛනයේ සඳහන් දේපළ 2022.12.05 වැනි දින පෙ. ව. 11.30 ට ද,**

**2 වන උපලේඛනයේ සඳහන් දේපළ 2022.12.05 වැනි දින ප. ව. 1.00 ට ද,**

පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මොරටුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොරළවැල්ල පිහිටි කොරළවැල්ල පාර, වරිපනම් අංක 65/27 දරන "කිරිපැලියගහවත්ත සහ කීනගහවත්ත, කිරිපැල්ලගහ කුඹුර සහ කීනගහ කුඹුර, මාදංගහවත්ත පාවුල ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. ඩී. අර්සකුලරත්න යන අය විසින් සාදන ලද 2008 පෙබරවාරි 28 දාතම හා අංක 747 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 12, නැගෙනහිරට : මෙහි ලොට් 3, දකුණට: කලින් ටී ගිරිගෝරිස් පීරිස්ගේ දේපළ, බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (P:20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 747 දරන එකී පිඹුරට අනුවය.

බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ ලොට් B දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

අංක 747 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 2, 1981 ඔක්තෝබර් 28 දාතම හා අංක 948 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 හි නැවත මිනුමක් වන අතර තවත් අයුරකින් පහතින් මැනවින් විස්තර කොට ඇති බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ නිරූපිත ලොට් A හි නැවන මිනුමක් ද වේ.

එකී කොරළවැල්ල පිහිටි "කිරිපැලියගහවත්ත සහ කීනගහවත්ත, කිරිපැල්ලගහ කුඹුර සහ කීනගහ කුඹුර, මාදංගහවත්ත පාවුල ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් B, නැගෙනහිරට: අංක 1497 දරන පිඹුරේ ලොට් 12B හි ඉතිරි කොටස, දකුණට: කලින් ටී ගිරිගෝරිස් පීරිස්ගේ දේපළ, බස්නාහිරට : අංක 1497 දරන පිඹුරේ ලොට් 12B හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (A:0, R:0, P:20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 5585 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 126/09 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1330 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වැල්ලවත්ත දකුණ ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ, වැල්ලවත්ත මූවර්ස් පාර පිහිටි මුවර්ස් පාර, වරිපනම් අංක 23 සහ 23A දරන "මහවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. සිංගනායගම් යන අය විසින් සාදන ලද 1968 නොවැම්බර් 23 දාතම හා අංක 1349 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මූවර්ස් පාර, නැගෙනහිරට : මෙහි ලොට් B, දකුණට: ලොට් D1 සහ D2, බස්නාහිරට : ලොට් $377^{01}$ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම තුනයි එකක් (A:0, R:0, P:22.31) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 1349 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව SPE 38/32 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1177 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

11-136

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ස්ටාගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0096 1000 0379

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.05.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට හතර ලක්ෂ හය දහස් හාරසියයි ශත හැට දෙකක (රු. 6,406,400.62) මුදලද, 2018 මැයි මස 11 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ පනස් අට දහස් පන්සියක (රු. 358,500.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළියද හා තවත් රුපියල් පනස් පන් ලක්ෂ එකොළොස් දහස් හාරසිය හතලිස් තුනයි ශත හතක (රු. 5,511,443.07) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.08.31 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2018.08.17 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.12.02 වැනි දින පෙ. ව. 11.30 ට** පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර කෝරළේ, උඩගම්පහ පත්තුවේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කුණ්ඩසාලේ උතුර අංක 691 දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ විදුරගේවත්ත - කුණ්ඩසාලේ පිහිටි "ගලමඩුව ගෘප් (තල්වත්ත එස්ටේට්) දැන් තේක්කවත්ත යනුවෙන් හඳුන්වනු ලබන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. එස්. බී. වැත්තෑව යන අය විසින් සාදන ලද 1998 පෙබරවාරි මස 09 දාතම හා අංක 2387 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 8 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 5, නැගෙනහිරට : ගරු රත්නායක සහ වෙනත් අයගේ ඉඩම, දකුණට : ලොට් 10 සහ 11 සහ බස්නාහිරට : ලොට් 11 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි බිංදුවක් (A:0, R:0, P:15.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2387 දරන පිඹුරට අනුව වෙළුම/ පත්‍රිරුව D 44/126 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එන්. එස්. බී. වැත්තෑව යන අය විසින් සාදන ලද 1998 පෙබරවාරි මස 09 දාතම හා අංක 2387 දරන පිඹුරේ ලොට් 11 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-137

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - යාපනය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය ග්‍රාම නිලධාරි වසම තුළ අංක 19, ජයා පාර, බම්බලපිටියේ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම දෙකයි පහ (පර්. 18.25) හෝ හෙක්ටයාර් 0.0461 ක් විශාලත්වයෙන් යුත් ඉඩම සමග ඒ තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් ඇතුලු සියලු දේ.

නැෂනල් බෑන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් ලියා සහතික කරන ලද අංක 6306 හා 2015.11.02 වැනි දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රිච් හවුසින් ප්‍රොපටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

විසින් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, එකී බැඳුම්කර යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දේපල,

වර්ෂ **2022 නොවැම්බර් මස 21 වැනි දින පෙරවරු 9.30 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ, කොට්ඨාස අංක 39හි මිලාගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ ජයා පාර, බම්බලපිටියේ පිහිටි දැනට වරිපනම් අංක 19, ජයා පාර දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද අංක 6038 හා 2015.07.05 වැනි දින දරන පිඹුරේ ලොට් 1ඒ (බලයලත් මිනින්දෝරු ආර්. පියසේන පෙරේරා විසින් සාදන ලද අංක ඩී/1 සහ 1951.05.21 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 නැවත මැනීමක් වන) වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ජයා පාර ද, නැගෙනහිරට : වරිපනම් අංක 17, ජයා පාර දරන පරිශ්‍රය ද, දකුණට: වරිපනම් අංක 18 සහ 22, මිලාගිරිය ඇවනිව් දරන පරිශ්‍රය සහ බස්නාහිරට : වරිපනම් අංක 23/1, ජයා පාර දරන පරිශ්‍රය ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම දෙකයි පහ (පර්. 18.25) හෝ හෙක්ටෙයාර් 0.0461 ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.*- 2022.09.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2022.10.05 වැනි දින ඩේලි මිරර්, මව්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - කොල්ලුපිටිය හන්දියේ සිට මැරීන් ඩ්‍රයිව් එක හරහා බම්බලපිටිය හන්දිය සහ ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය පසුකර ජය පාර දක්වා ගමන් කර වමට හැරී ජය පාර දිගේ දේපල දක්වා මද දුරක් ගමන් කරන්න. දේපල පිහිටා ඇත්තේ පාරේ දකුණු පැත්තේ, ස්පෑන් ටවර් රෙසිඩන්සීස් ඉදිරිපිටය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පලාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින (30) තිහක් ඇතුලත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 4329335 - 077 - 8441812.

11-139

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මරදගහමුල ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 87- පහළ හපුවලාන ග්‍රාම නිලධාරී වසම තුළ පහල හපුවලානේ පිහිටි හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි නමයයි තුනයි තුනක් (හෙක්ටෙයාර් 0.1933) හෝ රූඩ් එකයි පර්චස් තිස් හයයි දශම හතරයි දෙක (රූ. 01, පර්. 36.42) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 2013.11.22 දින දරන අංක 96 උකස් බැඳුම්කරය සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් සියල්ල ලියා සහතික කරන ලද 2017.12.07 දින 2020.06.26 දින දරන අංක 1058 හා අංක 1726 දරන උකස් බැඳුම්කර සහ 2016.02.10 දින දරන උකස්කිරීමේ සාධන පත්‍රය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එදිරිසිංහ ආරච්චිගේ

යමුනා චාන්දනී එදිරිසිංහ විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතලවලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලු ම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දේපළ,

වර්ෂ **2022** නොවැම්බර් මස **28** වැනි දින පෙරවරු **10.00** ට එකී දේපළ, පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 87 - පහළ හපුවලාන ග්‍රාම නිලධාරී වසම තුළ පහල හපුවලානේ පිහිටි ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක 510049 දරන කැඩැස්තර සිතියමේ අංක 01 කට්ටියේ දැක්වෙන අංක 0012 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි නමයයි තුනයි තුනක් (හෙක්ටෙයාර් 0.1933) හෝ රූඩ් එකයි පර්චස් තිස් හයයි දශම හතරයි දෙක (රූ. 01, පර්. 36.42) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.*- 2022 අගෝස්තු මස 05 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2022 අගෝස්තු මස 18 වැනි දින ඩේලි මිරර්, මව්බිම හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - මරඳගහමුල නගරයේ සිට දිවුලපිටිය පාර දිගේ මීටර් 250ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී (ටෙලිකොම් ගොඩනැගිල්ල ඉදිරිපිට) රන්විරු මාවත දිගේ කිලෝමීටරයක් ඉදිරියට ගොස් වමට හැරී වෙල්යාය පසුකර මීටර් 200 ක් ඉදිරියට යන්න. වමට හැරී මීටර් 300ක් ඉදිරියට ගොස් මාර්ගයේ වම් පස ඇති දේපළ වෙත ළඟා වන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තව ද, ගැණුම් මිලෙන් සියයට අනුවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින (30) තිහක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 4329335 - 077 - 8441812.

11-140

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ප්‍රධාන කාර්යාල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටු මහ නගර සභා සීමාව තුළ ලක්ෂපතියේ පිහිටි වරිපනම් අංක 129, අඟුලාන දුම්රියපොළ පාර දරන ''කුට්ටේරියවල එස්ටේට්'' නමැති ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් තිස් හයයි දශම තුනයි බිංදුවක් (අ. 3, පර්. 36.30) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ.

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් ලියා සහතික කරන අංක 3029 හා 2011.10.21 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නවලෝක කන්ස්ට්‍රක්ෂන් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දේපළ,

වර්ෂ **2022** නොවැම්බර් මස **29** වැනි දින පෙරවරු **11.30** ට එකී දේපළ, පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ ලක්ෂපතියේ පිහිටි වරිපනම් අංක 129, අඟුලාන දුම්රියපොළ පාර දරන 'කුට්ටේරියවල එස්ටේට්' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද අංක. 1230 හා 1972 මාර්තු මස 28/1972 අප්‍රේල් 11 දින දරන පිඹුරේ ලොට් 22 වශයෙන් ලකුණු කර ඇති බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අඟුලාන පාර ද, නැගෙනහිරට : එකී අංක 1230 දරන පිඹුරේ ලොට් 1 සිට 8 දක්වා ද, දකුණට : එකී අංක 1230 දරන පිඹුරේ ලොට් 10 සිට 14 දක්වා සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද අංක 502 හා 1965 පෙබරවාරි 23, 26 සහ 27 දින දරන පිඹුරේ ලොට් 46 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් තිස් හයයි දශම තුනයි බිංදුවක් (අ.3, පර්. 36.30) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමඟ වේ.

මෑතක දී කරන ලද මැනීමකට අනුව ඉහත කී ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ ලක්ෂපතියේ පිහිටි වරිපනම් අංක 129, අඟුලාන දුම්රියපොළ පාර දරන "කුට්ටේරියවල එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 8654 හා 2011 ඔක්තෝබර් මස 20 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අඟුලාන පාර ද, නැගෙනහිරට : එකී අංක 1230 දරන පිඹුරේ ලොට් 1 සිට 8 දක්වා ද, දකුණට : එකී අංක, 1230 දරන පිඹුරේ ලොට් 10 සිට 14 දක්වා සහ බස්නාහිරට : අඩි 20 ක් පළල පාර (බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද අංක 502 හා 1965 පෙබරවාරි 23, 26 සහ 27 දින දරන පිඹුරේ ලොට් 46) ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් තිස් හයයි දශම තුනයි බිංදුවක් (අ.3, පර්. 36.30) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමඟ වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* 2022 සැප්තැම්බර් මස 23 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2022 ඔක්තෝබර් මස 04 වැනි දින ඩේලි මිරර්, මව්බිම හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට කොළඹ - හම්බන්තොට වැල්ලවාය "A2" අධිවේගී මාර්ගය ඔස්සේ කිලෝමීටර් 15.5ක් පමණ ගොස් දකුණට අඟුලාන දුම්රියපොළ පාරට පිවිසෙන්න. එම මාර්ගයේ මීටර් 800 ක් පමණ දුරින් වමට 3 වන පටුමග පිහිටා ඇත. විෂය දේපළ 3 වන පටුමගට සහ අඟුලාන දුම්රිය ස්ථානයට මායිම්ව වම් පැත්තේ පිහිටා ඇත. විෂය දේපළ සිට කොළඹ කොටුවට ආසන්න වශයෙන් කිලෝමීටර් 16.4 කි.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැනුම් මිලෙන් සියයට අනුවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තව ද දින (30) තිහක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 4329335 - , 077 - 8441812.

11-141

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - රාජගිරිය ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සීමා තුළ 521 ඒ - ඇතුල් කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වරිපනම් අංක 27, අංගම්පිටිය පාර දරන ඇතුල් කෝට්ටේ පිහිටි ''කැටකෙලගහවත්ත'' නමැති පර්චස් දහය (පර්.10) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සෑම සියලු දේ.

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. එන්. එස්. සිල්වා විසින් සියල්ල ලියා සහතික කරන අංක 456 හා 2014 ජූනි මස 16 වැනි දින දරන අංක 1021 හා 2016.11.23 වැනි දින දරන සහ අංක 1372 හා 2018 සැප්තැම්බර් මස 26 වැනි දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යුනික් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතලවලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දේපළ,

වර්ෂ **2022 නොවැම්බර් මස 21 වැනි දින පෙරවරු 11.30 ට** එකී දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සීමා තුළ 521ඒ - ඇතුල් කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වරිපනම් අංක 27, අංගම්පිටිය පාර ඇතුල් කෝට්ටේ පිහිටි "කැටකෙලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද අංක 6562 හා 2014.03.04 දින දරන පිඹුරේ ලොට් ඒ1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංගම්පිටිය පාර ද, නැගෙනහිරට : වරිපනම් අංක 25, අංගම්පිටිය පාර ද, දකුණට : ලොට් ඒ2 සහ බස්නාහිරට : අංගම්පිටිය පාර ද මායිම් වූ එකී අංක 6562 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (පර්.10)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේද සමග වේ.

ඉහත කී ඉඩම් කොටස, පහත දැක්වෙන ඉඩම් කොටස නැවත මැන බෙදා වෙන් කරන ලද්දක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සීමාව තුළ 521ඒ - ඇතුල් කෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වරිපනම් අංක 27 අංගම්පිටිය පාර, ඇතුල් කෝට්ටේ පිහිටි "කැටකෙලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද අංක 2448 හා 1986.02.09 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංගම්පිටිය පාර ද, නැගෙනහිරට : ඒ. ජී. එන්. ජයරත්නගේ ඉඩම (වරිපනම් අංක 25, අංගම්පිටි පාර) ද, දකුණට : ඒ. ජී එන්. ජයරත්නගේ ඉඩම (වරිපනම් අංක 25, අංගම්පිටිය පාර) සහ ලොට් සී සහ බස්නාහිරට : අංගම්පිටිය පාර සහ ලොට් බී (පාරක් සඳහා වෙන්කිරීම) ද මායිම් වූ එකී අංක 2448 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම දෙකක් (පර්.16.2) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේද සමග වේ.

ඉහත කී අංක 456, 1021 සහ 1372 දරන උකස් බැඳුම්කරවල දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද අංක 2448 හා 1986.02.09 වැනි දින දරන පිඹුරේ ලොට් බී මතින් හා ඒ දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* 2022 සැප්තැම්බර් මස 30 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2022 ඔක්තෝබර් මස 05 වැනි දින ඩේලි මිරර්, මව්බිම හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - රාජගිරිය - වැලිකඩ හන්දියේ සිට ශ්‍රී ජයවර්ධන පුර මාර්ගය ඔස්සේ කිලෝමීටර් 1.2 ක් පමණ ඉදිරියට ගොස් ඇතුල්කෝට්ටේ මාර්ගයට දකුණට හැරී පිටකෝට්ටේ දෙසට ගමන් කර දකුණු පස අංගම්පිටිය පාරට පැමිණෙන්න. අංගම්පිටිය පාරට හැරී මීටර් 150 ක් පමණ ඉදිරියට ගොස් වංගුවේ වම් පස ඇති විෂය දේපළ වෙත ළඟා විය හැක. විෂය දේපළ සිට පිටකෝට්ටේ හන්දියට සහ ඇතුල්කෝට්ටේ හන්දියට ආසන්න වශයෙන් කිලෝමීටර් 1.3ක් සහ වැලිකඩට කිලෝමීටර් 2.5ක් සහ කොළඹට කිලෝමීටර් 10.2කි.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

